Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- පුරවැසි අධ්‍යාපනය

1 සතිය

7 ශ්‍රේණිය

## අපේ පවුල

සමාජයේ මූලික තැනුම් ඒකකය පවුල වන අතර සමාජයේ වැදගත් ම ඒකකය ද පවුල වේ.පුද්ගලයා උපතත් සමඟ පවුලේ සාමාජිකයෙකු බවට පත් වේ.සමාජයේ කුඩාම ඒකකය පවුල වන අතර පවුල් ඒකක රාශියකින් ජන සමාජයක් බිහි වේ.වර්තමාන සමාජයේ පවුල් ඒකක වර්ග දෙකකි.

පවුල් වර්ග

න්‍යෂ්ටික පවුල | විස්තෘත පවුල

(න්‍යෂ්ටික පවුල ඇඳ පාට කරන්න.පහතින් එහි සාමාජිකයින් නම් කරන්න.)

- 
- 
- 
- 

(විස්තෘත පවුල ඇඳ පාට කරන්න.පහතින් එහි සාමාජිකයින් නම් කරන්න. )

- 
- 
- 
- 

1. විස්තෘත පවුල යන්න කෙටියෙන් හඳුන්වන්න.
2. න්‍යෂ්ටික හා විස්තෘත පවුලේ ලක්ෂණ වරහන තුළින් තෝරා වගු ගත කරන්න.

උදා-

| විස්තෘත පවුල | න්‍යෂ්ටික පවුල |
|---|---|
| සාමාජික සංඛ්‍යාව වැඩි නිසා ශක්තිය වැඩියි. | සාමාජික සංඛ්‍යාව අඩු නිසා ශක්තිය අඩුයි |

( සංස්කෘතිය පවරා දීම පහසු වේ,ශ්‍රමය ලබා ගැනීම අපහසු වේ,තනිව සියලු වගකීම් දැරිය යුතුය, සංස්කෘතිය පවරා දීම අපහසු වේ,ශ්‍රමය පහසුවෙන් ලබා ගත හැකිය,වගකීම් බෙදී ගොස් ඇත,දරුවන් රැක බලා ගැනීමේ වගකීම සාමාජිකයන් අතර බෙදී ඇත,තනිව / වෙනත් ආකාරයකට රැක බලා ගත යුතුය.)

3. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 06 ක් ලියන්න.
4. පවුලක සාමාජිකයකු වශයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 06 ක් ලියන්න.